## ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය - 2017

-----------------------------------------------

ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 9 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සංගමයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විධායක කමිටුවේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම විධායක කමිටුවේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංගමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිතයේ පරිච්ඡේද 17 හි 19 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.233,490 ක් වූ පරිගණක උපාංග සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු ගත දෝෂය ප්‍රමිතයේ පරිච්ඡේද 10 හි 18 ඡේදය ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ පරිච්ඡේද 2 හි 52 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණය ගිණුම්කරණ ප්‍රමිතවලින් අවසර දී ඇති විටෙක හැර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී ලැබිය යුතු රු. 1,445,758 ක් වූ හර ශේෂයන් 10 ක එකතුවෙන් ගෙවිය යුතු රු.10,687 ක් වූ බැර ශේෂයන් දෙකක් සහ රු. 3,000 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂයක් හිලව් කර රු.1,432,071 ක් ශේෂ පත්‍රයේ ජංගම වත්කම්වල ලැබිය යුතු ශේෂය ලෙස දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය වෙත ක්‍රීඩා තරඟවලට අදාළ විදේශ සංචාරයන් සඳහා රු.13,109,475 ක් පිරිවැය වූ ගුවන් ටිකට්පත් හා රු.8,642,864 ක් වූ මුදල් ප්‍රදානයන් ලබා දී තිබුණද එම වටිනාකම සංගමයේ ආදායම් හා වියදම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයේ සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම වෙනුවෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.500,000 ක් වර්ෂයේ ආදායම හා ලැබිය යුතු ආදායම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පරිගණක උපාංග ක්ෂය රු.58,372 ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ ලැබිය යුතු ලෙස දක්වා තිබුණු එකතුව රු.24,920 ක් වූ වර්ෂ 05 ක් පැරණි ගිණුම් 02 ක ශේෂයන් හා එකතුව රු.109,446 ක් වූ වර්ෂ 02 කට වඩා පැරණි ගිණුම් 02 ක ශේෂයන් අයකර ගැනීමට ජාතික බැඩ්මින්ටන් සංගමය කටයුතු කර නොතිබුණි.

(ආ) උපචිත වියදම්වල ඇතුළත් වර්ෂ 05 කට වඩා පැරණි රු.2,290,429 ක් වූ ගිණුම් 15 ක් සහ අනෙකුත් වගකීම්වල ඇතුළත් වර්ෂ 3 ත් වර්ෂ 5 අතර පැරණි රු.3,746,110 ක් වූ ගිණුම් 04 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) උපචිත වියදම් තුළ ඇතුළත් ගෙවියයුතු සේවක අර්ථ සාධක අරමුදල් රු.29,300 ක් හා සේවක භාර අරමුදල් රු.10,680 ක් හඳුනානොගත් පැරණි ශේෂයන් වූ බැවින් එම ශේෂයන් සම්බන්ධයෙන් ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | |
| (i) මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ මාස 6 ඉකුත් වූ එකතුව රු.57,517 ක් වූ චෙක්පත් 3 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට සංගමය කාලීනව පියවර ගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 757 | වර්ෂය අවසානයේ වත්කම් භෞතිකව පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සංගමයේ රු.2,695,363 ක් වූ ස්ථාවර වත්කම් පැවතියත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංගමයේ වූ මූල්‍ය ප්‍රතිඵලය රු.6,184,395 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.383,171 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,801,224 කින් වර්ධනය වී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව ආදායම රු.5,430,677 කින් වැඩි වීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක විය යුතු වු නමුත් සංගමය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) අයවැය පාලනය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව ඵලදායි මූල්‍ය පාලනයක් සඳහා එක් එක් මුල්‍ය වර්ෂය ආරම්භ වීමට ප්‍රථම අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු වුවද සංගමය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**(ඇ) ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාර කාලපරිච්ඡේදය තුළ ළඟා කර ගත යුතු අරමුණු හා ඉලක්ක ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්මක් 2017 වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු සංගමයේ සභාපති වෙත වරින් වර පෙන්වා දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ගිණුම්කරණ ප්‍රතිපත්ති හඳුනාගෙන ඒ අනුව ගිණුම් පිළියෙල නොකිරීම. |
| (ආ) අයවැය පාලනය | අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හැකිවන පරිදි අයවැය පාලන පද්ධතියක් නොතිබීම. |